ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 1759/43 - 2012 මැයි මස 25 වැනි සිකුරාදා - 2012.05.25

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

### ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි අධිකාරය)

මගේ අංකය : 4/3/1 (පත්කිරීම් - අත්පත්).

460 වැනි අධිකාරය මත ඉඩම් අත්කර ගැනීමේ පනතේ 63(2) අ වගන්තිය යටතේ ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍ය ජනක බණ්ඩාර තෙන්නකෝන් වන මම 2008.06.27 වැනි දිනැති අංක 1555/28 දරන ගැසට් නිවේදනය මගින් මුතුනායක තිලකරත්න මහතා ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියෙකු ලෙස කරන ලද පත් කිරීම අවලංගු කරන අතර පහත සඳහන් නියෝගය මෙයින් නියම කරමි.

*නියෝග අංකය : 2012/4 - පත්කිරීම සංශෝධනය කිරීම*

මාර්ග සංවර්ධන අධිකාරිය සඳහා මහා මාර්ග ව්‍යාපෘතිවලට ඉඩම් අත්කර ගැනීමේ කටයුතු කඩිනම් කිරීම සඳහා I උපලේඛනයේ දක්වා ඇති ප්‍රදේශ තුළ II වැනි උපලේඛනයේ දක්වා ඇති නිලධාරියාට III වැනි උපලේඛනයේ දක්වා ඇති කාලසීමාව දක්වා ඉඩම් අත්කර ගැනීමේ පනත යටතේ අත්කර ගැනීමේ කාර්ය සඳහා නියමිත නිලධාරියෙකු ලෙස මෙයින් නියම කරනු ලැබේ.

| *I උපලේඛනය*<br>*බල ප්‍රදේශය* | *II උපලේඛනය*<br>*නිලධාරියාගේ නම* | *III උපලේඛනය*<br>*කාල සීමාව* |
|---|---|---|
| *දිස්ත්‍රික්ක :* | | |
| පොළොන්නරුව, අම්පාර<br>මඩකලපුව, මහනුවර<br>මාතලේ, නුවරඑළිය<br>බදුල්ල, අනුරාධපුරය | මුතුනායක තිලකරත්න මහතා,<br>(ශ්‍රී ලංකා මහවැලි සංවර්ධන<br>අධිකාරියේ පරිපාලන නිලධාරී<br>විශ්‍රාමික) | 2011.11.01 වැනි දින සිට<br>නැවත නියමයක්<br>කරන තුරු |

ජනක බණ්ඩාර තෙන්නකෝන්,
ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍ය.

2012 මැයි මස 22 වැනි දින,
ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය,
"මිහිකත මැදුර", අංක 1200/6,
රජමල්වත්ත පටුමඟ, බත්තරමුල්ල.

06 - 423

1A - G 016087 — 355 (2012/05) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.